## මුතූර් ප්‍රාදේශීය සභාව

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 27 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 30 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කර ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මුතූර් ප්‍රාදේශීය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මුතූර් ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

2012 වර්ෂය තුලදී ආදායම් ඉපයීම සහ සේවා සැපයීම සඳහා සභාව එකතු වටිනාකම රු.29,146,308 ක් වූ ස්ථාවර වත්කම් භාවිතා කර තිබුණි. නමුත් ගිණුම් වල ස්ථාවර වත්කම්

ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. එම නිසා ආදායම් ඉපයීම සඳහා කරන ලද වියදම් මූල්‍ය ප්‍රකාශනයන්හි පිළිඹිබු නොවන බව නිරික්ෂණය විය.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) වටිනාකම රු.62,400 ක්වූ පොත් ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ආ) විගණන ගාස්තු රු. 17,615 ක් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) නිලධාරින්ට දෙන ලද ණය, ගිණුම් වල රු.28,809 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2012 වර්ෂයේදි මිලදි ගත් ප්‍රාග්ධන භාණ්ඩ වල වටිනාකම වු රු.74,880 ක් අයභාර වියදම් ලෙස සටහන් කර තිබුණි.

1.3.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

(අ) 1997 වර්ෂය සඳහා නොගෙවු දුරකථන ගාස්තු රු.23,806 ක් තැන්පතු ගිණුමෙහි දක්වා තිබුණි.

(ආ) 1986 වර්ෂයේ සිට සේවකයන්ගෙන් අයකර ගන්නා ලද සේවක අර්ථසාධක අරමුදලේ සහ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායක මුදල් රු.35,609,022 ක් අදාල ආයතනයන් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) 2003 වර්ෂයේදි කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවා ගන්නා ලද රු.615,702 ක් වු මුදල් ගෙවීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2000 ඔක්තෝබර් 31 දිනට ගොවිජන සේවා කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතු රු.26,115 ක මුදලක් ප්‍රේෂණය නොකොට වර්ෂ 10 කට අධික කාලයක් තැන්පතු ගිණුමෙහි තබාගෙන තිබුණි.

(ඉ) සභාවේ නිලධාරින්ගේ වැටුපෙන් අයකර ගන්නා ලද රු.3891 ක් වු විශ්‍රාම වැටුප් දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකොට 2004 ජනවාරි 22 දින සිට තැන්පත් ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම නිසා පහත සඳහන් විෂයයන් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 4,443,627 | ස්ථාවර වත්කම් ලේඛණය, මැනුම් සිතියම්, හිමිකම් වාර්තා |
| පිරියත් සහ යන්ත්‍ර සූත්‍ර | 618,617 | ස්ථාවර වත්කම් ලේඛණය, සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| මෝටර් වාහන | 23,026,590 | |
| ආදායම් තැන්පතු | 16,607,885 | කාල විශ්ලේෂණ, විස්තරාත්මක උපලේඛණ |
| ටෙන්ඩර් තැන්පතු | 2,328,850 | |
| කොන්ත්‍රාත්කරුවන්ගේ තැන්පතු | 67,845 | |
| විවිධ තැන්පතු | 287,280 | |
| විදුලි තැන්පතු | 1,598,625 | |
| ගෙවන ලද අත්තිකාරම් | 3,832,978 | විස්තරාත්මක උපලේඛණ |
| ආරක්ෂක තැන්පතු | 6,858,099 | |

1.3.5 අවිනිශ්චිත ගිණුම

2000 වර්ෂයේ සිට අවිනිශ්චිත ගිණුමේ පවතින රු.16,574 ක් වූ බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.6 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | |
| (i) II කොටසේ 158 වගන්තිය | - | සභා බල ප්‍රදේශය තුල වරිපනම් බදු අයකර නොතිබුණි. |
| (ii) II කොටසේ 4 වගන්තිය | - | එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර බදු ගෙවන්නන්ට වරිපනම් බදු නිවේදන යැවිය යුතු වුවද, එසේ යවා නොතිබුණි. |
| (ආ) ප්‍රාදේශිය සභා මූල්‍ය සහ පරිපාලන රීති - 1989 | | |
| (i) VII පරිච්ඡේදයේ 140 වගන්තිය | - | වර්ෂ 03 කට පෙර ගෙවන ලද රු.3,832,977 ක් වූ අත්තිකාරම් මෙතෙක් අයකරගෙන නොතිබුණි. |
| (ii) VII පරිච්ඡේදයේ 152 වගන්තිය | - | ලැබීම් පිළිබඳ මාසික සාරාංශ තුලනය කර නොතිබුණි. |
| (iii) VII පරිච්ඡේදයේ 153 වගන්තිය | - | හිඟ ආදායම් පිළිබඳ මාසික සාරාංශ තුලනය කර නොතිබුණි. |
| (iv) VII පරිච්ඡේදයේ 154 වගන්තිය | - | උපකාර්යාල රැස්කිරිම් ගිණුම තුලනය කර නොතිබුණි. |
| (v) VII පරිච්ඡේදයේ 164 වගන්තිය | - | ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් ගිණුම් ලේඛන දෛනිකව හරිවැරදි බලා කෙටි අත්සන් යොදා නොතිබුණි. |
| (vi) IX පරිච්ඡේදයේ විවිධ 181-184 වගන්ති | - | මුදල් සහ ගබඩා පරිහරණය කරනු ලබන නිලධාරින්ගෙන් ආරක්ෂක තැන්පතු ලබාගෙන නොතිබුණි. |

(ඈ) මුදල් රෙගුලාසි

| | | |
|---|---|---|
| (i) 396 | - | 2012 වර්ෂයේදි නිකුත් කරන ලදුව මාස 06 ක අධික කාලයක් මුදල් කර නොතිබු වටිනාකම රු.376,578 ක් වු චෙක්පත් 53 ක් මුදල් කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ii) 571 (2) | - | රු.3,742,088 ක් වු මුදලක් පසුගිය වර්ෂ 30 ක් පුරා කල් ඉකුත් වූ තැන්පතු ලෙස අඛණ්ඩවම දක්වා තිබුණි. 2012 දෙසැම්බර් 31 දක්වා මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

(ඇ) පළාත් මුදල් රෙගුලාසි

| | | |
|---|---|---|
| (i) අංක 751 | - | 2012 වර්ෂයේදි මිලදි ගන්නා ලද රු.883,480 ක් වටිනා තොග, තොග ලේඛනයෙහි සටහන් කර නොතිබුණි. |
| (ii) අංක 432 | - | 2012 වර්ෂය සඳහා වාහන ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මුල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 27,575,995 ක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,203,924 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් සහ බදු | 4,456 | 226 | 4,230 |
| (ii) | බදු කුලී | 14,005 | 2,801 | 11,499 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 564 | 472 | 91 |
| (iv) | වෙනත් ආදායම් | 9 | 1 | 8 |

## 2.3 අනුමැතිය නොමැතිව ගෙවූ වැටුප්

බඳවා ගැනීම් පරිපාටිය අනුගමනය නොකොට සහ පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය නොමැතිව පත්කරන ලද කම්කරුවන් 30 දෙනෙකුට 2012 වර්ෂය තුල සභා අරමුදල් වලින් රු.6,415,310 ක් වූ වැටුප් ගෙවා තිබුණි.

## 2.4 මානව සම්පත් කළමනාකරණය

2012 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු /අතිරික්තය |
|---|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණි | 16 | 13 | 3 |
| සහායක කාර්ය මණ්ඩලය | 14 | 8 | 6 |
| සුළු සේවක | 51 | 43 | 8 |
| වෙනත් | - | 32 | (32) |
| (අනියම්/තාවකාලික) | - | | |
| | 81 | 96 | |

2.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) ඇස්තමේන්තු අනුක්‍රමිකව ලේඛණයෙහි සටහන් කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත්තු වැඩ රු.100,000 ඉක්මවන අවස්ථාවන්හිදී, ප්‍රාදේශිය සභා මූල්‍ය සහ පරිපාලන රීති සංග්‍රහයෙහි vii පරිච්ඡේදයේ 178(5) වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධ මිල කැඳවීමක් කර නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුවන්ගෙන් බැංකු ඇපකර ලබාගෙන නොතිබුණි.

(ඈ) අනුමත සමිති වලට කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරිමේදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 3.9.1 වගන්ති ප්‍රකාරව අවශ්‍ය කෙරෙන ලියකියවිලි ඉදිරිපත් කර නොතිබුණි.

3. පද්ධති සහ පාලන

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය ලේඛණය

(ආ) ගිණුම්කරණය

(ඇ) ස්ථාවර වත්කම්

(ඈ) තොග

(ඉ) අත්තිකාරම්

(ඊ) ආදායම් රැස්කිරීම.